# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1363/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 23/08/2024 පැය 0825

## මාධ්‍ය නිවේදනය

**විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම දෙවන අදියර - පොලිස් මූලස්ථානය.**

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට ක්‍රියාත්මක වූ යුක්තිය විශේෂ මෙහෙයුම දෙවන අදියර සක්‍රීයව වඩාත් තීව්‍ර කරමින් 2024.07.04 වන දින සිට ආරම්භ කරන ලදි.

ඒ අනුව මෙම යුක්තිය මෙහෙයුමේ දෙවන අදියර 2024.08.22 වන දිනය තුල සිදු කරන ලද මුළු වැටලීම් 696 කට අදාලව සැකකරුවන් 684 ක් හා සැකකාරියන් 08 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් 11 ක් වැඩිදුර විමර්ශනය සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිතව ඇති අතර එක් සැකකරුවෙකුගේ වත්කම් විමර්ශනය සඳහා නියමිතයි. එක් සැකකරුවෙකු පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**මෙම මෙහෙයුමේදී බස්නාහිර පළාත ආවරණය වන පරිදි සිදුකරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වලදී හෙරොයින් ග්‍රෑම් 136 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 174 ක් හා ගංජා ග්‍රෑම් 617 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 439 කදී සැකකරුවන් 434 ක් හා සැකකාරියන් 05 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**මෙම මෙහෙයුමේදී දකුණු පළාත ආවරණය වන පරිදි සිදුකරන ලද වැටලීම් වලදී හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 ක් හා ගංජා ග්‍රෑම් 106 ක් අත්අඩංගුවට ගෙන ඇති අතර සිදු කරන ලද මුළු වැටලීම් 72 කදී සැකකරුවන් 72 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**2024.08.22** වන දින වැටලීමට අදාල විශේෂිත සංඛ්‍යා තොරතුරු පහත සඳහන් කර ඇත.

| **වැටලීම් සම්බන්ධ වාර්තාව.** | | |
|---|---|---|
| හෙරොයින් | ප්‍රමාණය (g / mg) | 258.443 |
| අයිස් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 611.183 |
| ගංජා | ප්‍රමාණය (g /mg) | 1253.341 |
| ගංජා පැළ | ප්‍රමාණය | 8919 |
| වෙනත් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 330.345 |
| මුළු වැටලීම් ගණන | | 696 |
| අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | ස්ත්‍රී | 08 |
| | පුරුෂ | 684 |
| රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගත් සැකකරුවන් ගණන | | 11 |
| වත්කම් විමර්ශනය සඳහා නියමිත සැකකරුවන් ගණන | | 01 |
| පුනරුත්ථාපනය සඳහා යොමු කිරිමට නියමිත සැකකරුවන් ගණන | | 01 |
| නීති විරෝධී මත්පැන් | ප්‍රමාණය (ලීටර්) | 2583 |
| ගෝඩා | ප්‍රමාණය (ලීටර්) | 12717 |

**2024.08.22 වන දින අත්අඩංගුවට ගත් වරෙන්තුකරුවන් හා බල අපරාධ සැකකරුවන් සම්බන්ධව වාර්තාව.**

| | |
|---|---|
| විෂ මත්ද්‍රව්‍ය නොවන වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් විවෘත වරෙන්තුකරුවන් ගණන | 07 |
| ඇඟිලි සටහන් ඔස්සේ අනාවරණය කරගෙන ඇති සැකකරුවන් ගණන | 01 |

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**